# මහා වෙදල්ල සූත්‍රය

**එවං මෙ සුතං - එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො ආයස්මා මහාකොට්ඨිකො සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙනායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කමි; උපසඞ්කමිත්වා ආයස්මතා සාරිපුත්තෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා මහාකොට්ඨිකො ආයස්මන්තං සාරිපුත්තං එතදවොච**

මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි වූ, අනේපිඩු මහ සිටුහු විසින් කරවන ලද ජේතවන නම් විහාරයෙහි වැඩ වාසය කරති. එකල්හි ආයුෂ්මත් මහා කොට්ඨිත ස්ථවිරයන් වහන්සේ සවස් කාලයෙහි පලසමවතින් නැගීසිටියේ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට ගියහ. ගොස්, ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ සමග සතුටු වූහ. සතුටු විය යුතු සිහි කටයුතු කථාකොට නිමවා එකපැත්තක උන්හ. එකපැත්තක උන්නාවූ ආයුෂ්මත් මහා කොට්ඨිත ස්ථවිරයන් වහන්සේ, ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට මෙසේ කීහ.

**01 දුප්පඤ්ඤො දුප්පඤ්ඤො' ති, ආවුසො, වුච්චති. කිත්තාවතා නු ඛො, ආවුසො, දුප්පඤ්ඤොති වුච්චතී' ති?**

ඇවැත්නි, 'දුෂ්ප්‍රාඥාය, දුෂ්ප්‍රාඥය' යි (නුවණ නැති තැනැත්තේය, නුවණ නැතිතැනැත්තේයයි) කියනු ලැබේ. ඇවැත්නි, කොපමණකින් දුෂ්ප්‍රාඥයයි කියනු ලැබේද,

**නප්පජානාති නප්පජානාතී' ති ඛො, ආවුසො, තස්මා දුප්පඤ්ඤොති වුච්චති.**

**කිඤ්ච නප්පජානාති? ඉදං දුක්ඛ' න්ති නප්පජානාති, 'අයං දුක්ඛසමුදයො' ති නප්පජානාති, 'අයං දුක්ඛනිරොධො' ති නප්පජානාති, 'අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා' ති නප්පජානාති. 'නප්පජානාති නප්පජානාතී' ති ඛො, ආවුසො, තස්මා දුප්පඤ්ඤොති වුච්චතී' ති.**

ඇවැත්නි, නොදනියි, නොදනියි, යන අර්ථයෙන් දුෂ්ප්‍රාඥ (නුවණ නැත්තේ) යයි කියනු ලැබේ. කුමක් නොදනීද? මෙය දුකයයි නොදනී. මේ දුක් ඉපදීමට හේතුවයයි නොදනී. මේ දුක් නැතිකිරීමයයි නොදනී, මේ දුක් නැතිකිරීමේ මගයයි නොදනී. ඇවැත්නි, යම් හෙයකින් නොදනීද නොදනීද එහෙයින් දුෂ්ප්‍රාඥයයි කියනු ලැබේ."

**සාධාවුසො' ති ඛො ආයස්මා මහාකොට්ඨිකො ආයස්මතො සාරිපුත්තස්ස භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා ආයස්මන්තං සාරිපුත්තං උත්තරිං පඤ්හං අපුච්ඡි** -

යහපත ඇවැත්නි,' කියා ආයුෂ්මත් මහා කොට්ඨිත ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙන අනුමොදන්ව ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන්ගෙන් ඊළඟ ප්‍රශ්නය විචාළහ

**02 පඤ්ඤවා පඤ්ඤවා' ති, ආවුසො, වුච්චති. කිත්තාවතා නු ඛො, ආවුසො, පඤ්ඤවාති වුච්චතී' ති?**

ඇවැත්නි, ප්‍රාඥය ප්‍රාඥය (නුවණ ඇතිතැනැත්තේය, නුවණ ඇතිතැනැත්තේය) යයි කියනු ලැබේ. ඇවැත්නි, කොපමණකින් ප්‍රාඥයයි කියනු ලැබේද?

**පජානාති පජානාතී' ති ඛො, ආවුසො, තස්මා පඤ්ඤවාති වුච්චති.**

**කිඤ්ච පජානාති? 'ඉදං දුක්ඛ' න්ති පජානාති, 'අයං දුක්ඛසමුදයො' ති පජානාති, 'අයං දුක්ඛනිරොධො' ති පජානාති, 'අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා' ති පජානාති.**

**‘පජානාති පජානාතී’ ති ඛො, ආවුසො, තස්මා පඤ්ඤවාති වුච්චතී’ති.**

ඇවැත්නි, යම් හෙයකින් මනාව දනියිද මනාව දනියිද, එහෙයින් ප්‍රාඥයයි කියනු ලැබේ. කුමක් දනීද? මෙය දුකයයි දනියි. මේ දුක් ඉපදීමේ හේතුවයයි දනියි. මේ දුක් නැතිකිරීමයයි දනියි. මේ දුක් නැති කිරීමේ මගයයි දනියි. ඇවැත්නි, යම් හෙයකින් දනීද දනීද එහෙයින් ප්‍රාඥයයි කියනු ලැබේ.

**03 විඤ්ඤාණං විඤ්ඤාණ’ න්ති, ආවුසො, වුච්චති. කිත්තාවතා නු ඛො, ආවුසො, විඤ්ඤාණන්ති වුච්චතී’ ති?**

ඇවැත්නි, විඤ්ඤාණය විඤ්ඤාණය (විශේෂයෙන් දැනීම විශේෂයෙන් දැනීම) යයි කියනු ලැබේ. ඇවැත්නි, කොපමණකින් විඥානයයයි කියනු ලැබේද?

**විජානාති විජානාතී’ ති ඛො, ආවුසො, තස්මා විඤ්ඤාණන්ති වුච්චති.**

**කිඤ්ච විජානාති?**

**සුඛන්තිපි විජානාති, දුක්ඛන්තිපි විජානාති, අදුක්ඛමසුඛන්තිපි විජානාති. ‘විජානාති විජානාතී’ ති ඛො, ආවුසො, තස්මා විඤ්ඤාණන්ති වුච්චතී’ ති.**

ඇවැත්නි, යම් හෙයකින් විශේෂයෙන් දනීද, විශේෂයෙන් දනීද, එහෙයින් විඥානයයි කියනු ලැබේ.’කුමක් දනීද? මේ සැප වේදනාවයයි දනියිද. මේ දුක් වේදනාවයයි දනීද, මේ උපෙක්ෂා වේදනාවයයි දනීද, ඇවැත්නි, යම් හෙයකින් විශේෂයෙන් දනීද, එහෙයින් විඥානයයි කියනු ලැබේ

**04 යා චාවුසො, පඤ්ඤා යඤ්ච විඤ්ඤාණං - ඉමෙ ධම්මා සංසට්ඨා උදාහු විසංසට්ඨා? ලබ්භා ච පනිමෙසං ධම්මානං විනිබ්භුජිත්වා විනිබ්භුජිත්වා නානාකරණං පඤ්ඤාපෙතු’ න්ති?**

ඇවැත්නි, යම් මේ ප්‍රඥාවක් වේද, යම් මේ විඥානයක් වේද, මේ ධර්මයෝ ඔවුනොවුන් එක්ව පවත්නාහුද? නැතහොත් වෙන් වෙන්ව පවත්නාහුද, මේ ධර්මයන් ඔවුනොවුන් වෙන් වෙන් කොට වෙනස දක්වන්නට හැකිද**?**

**යා චාවුසො, පඤ්ඤා යඤ්ච විඤ්ඤාණං - ඉමෙ ධම්මා සංසට්ඨා, නො විසංසට්ඨා. න ච ලබ්භා ඉමෙසං ධම්මානං විනිබ්භුජිත්වා විනිබ්භුජිත්වා නානාකරණං පඤ්ඤාපෙතුං. යං හාවුසො පජානාති තං විජානාති, යං විජානාති තං පජානාති. තස්මා ඉමෙ ධම්මා සංසට්ඨා, නො විසංසට්ඨා. න ච ලබ්භා ඉමෙසං ධම්මානං විනිබ්භුජිත්වා විනිබ්භුජිත්වා නානාකරණං පඤ්ඤාපෙතු' ' න්ති.**

ඇවැත්නි, යම් මේ ප්‍රඥාවක් වේද, යම් මේ විඥානයක් වේද, මේ ධර්මයෝ එක්ව පවත්නාහුය. වෙන් වෙන්ව නොපවත්නාහුය. මේ ධර්මයන් වෙන් වෙන් කොට වෙනස දක්වන්නට නොහැකිය. ඇවැත්නි, යමක් ප්‍රඥාවෙන් දනීද, විඥානයෙන් එය දනියි. විඥානයෙන් යමක් දනීද, ප්‍රඥාවෙන්ද එය දනියි. එහෙයින් මේ ධර්මයෝ එක්ව පවත්නාහුය වෙන්ව නොපවත්නාහුය. මේ ධර්මයන් ඔවුනොවුන් වෙන් වෙන් කොට ඔවුන්ගේ වෙනස දක්වන්නට බැරිය.

**05 යා චාවුසො, පඤ්ඤා යඤ්ච විඤ්ඤාණං - ඉමෙසං ධම්මානං සංසට්ඨානං නො විසංසට්ඨානං කිං නානාකරණ' න්ති?**

ඇවැත්නි, යම් ප්‍රඥාවකුත් වේද, යම් විඥානයකුත් වේද, එක්ව පවත්නාවූ වෙන්ව නොපවත්නාවූ මේ ධර්මයන්ගේ වෙනස කවරේද?

**යා චාවුසො, පඤ්ඤා යඤ්ච විඤ්ඤාණං - ඉමෙසං ධම්මානං සංසට්ඨානං නො විසංසට්ඨානං පඤ්ඤා භාවෙතබ්බා, විඤ්ඤාණං පරිඤ්ඤෙය්‍යං. ඉදං නෙසං නානාකරණ' න්ති.**

ඇවැත්නි, යම් ප්‍රඥාවකුත් වේද, යම් විඥානයකුත් වේද, එක්ව පවත්නාවූ වෙන්ව නොපවත්නාවූ මේ ධර්මයන් අතුරෙන් ප්‍රඥාව වැඩිය යුතුය. විඥානය පිරිසිඳ දතයුතුය. මෙය ඔවුන්ගේ වෙනසයි.

**06 වෙදනා වෙදනා' ති, ආවුසො, වුච්චති. කිත්තාවතා නු ඛො, ආවුසො , වෙදනාති වුච්චතී' ති?**

ඇවැත්නි, වේදනාවය, වේදනාවයයි කියනු ලැබේ. ඇවැත්නි, කොපමණකින් වේදනාවයයි කියනු ලැබේද?

**වෙදෙති වෙදෙතී' ති ඛො, ආවුසො, තස්මා වෙදනාති වුච්චති.කිඤ්ච වෙදෙති? සුඛම්පි වෙදෙති, දුක්ඛම්පි වෙදෙති, අදුක්ඛමසුඛම්පි වෙදෙති. 'වෙදෙති වෙදෙතී' ති ඛො, ආවුසො, තස්මා වෙදනාති වුච්චතී' ති.**

ඇවැත්නි, යම් හෙයකින් විඳීද, විඳීද එහෙයින් වේදනාවයයි කියනු ලැබේ. කුමක් විඳීද, සැපද විඳියි, දුකද විඳියි, උපෙක්ෂාවද විඳියි. ඇවැත්නි, යම් හෙයකින් විඳීද, විඳීද එහෙයින් වේදනාවයයි කියනු ලැබේ.

**07 සඤ්ඤා සඤ්ඤා' ති, ආවුසො, වුච්චති. කිත්තාවතා නු ඛො, ආවුසො, සඤ්ඤාති වුච්චතී' ති?**

ඇවැත්නි, සංඥාවය, සංඥාවයයි කියනු ලැබේ. ඇවැත්නි, කොපමණකින් සංඥාවයයි කියනු ලැබේද?

**සඤ්ජානාති සඤ්ජානාතී' ති ඛො, ආවුසො, තස්මා සඤ්ඤාති වුච්චති.**

**කිඤ්ච සඤ්ජානාති? නීලකම්පි සඤ්ජානාති, පීතකම්පි සඤ්ජානාති, ලොහිතකම්පි සඤ්ජානාති, ඔදාතම්පි සඤ්ජානාති. 'සඤ්ජානාති සඤ්ජානාතී' ති ඛො, ආවුසො, තස්මා සඤ්ඤාති වුච්චතී' ති.**

යම් හෙයකින් හඳුනයිද, හඳුනයිද, ඇවැත්නි, එහෙයින් සංඥාවයයි කියනු ලැබේ. කුමක් හඳුනයිද? නිල් පාටයයි හඳුනයි. කහපාටයයි හඳුනයි. ලේ පාටයයි හඳුනයි. සුදු පාටයයි හඳුනයි. ඇවැත්නි, යම් හෙයකින් හඳුනයිද, හඳුනයිද එහෙයින් සංඥාවයයි කියනු ලැබේ.

**08 යා චාවුසො, වෙදනා යා ච සඤ්ඤා යඤ්ච විඤ්ඤාණං - ඉමෙ ධම්මා සංසට්ඨා උදාහු විසංසට්ඨා? ලබ්භා ච පනිමෙසං ධම්මානං විනිබ්භුජිත්වා විනිබ්භුජිත්වා නානාකරණං පඤ්ඤාපෙතු' න්ති?**

ඇවැත්නි, යම් වේදනාවක් වේද, යම් සංඥාවක් වේද, යම් විඥානයක් වේද, මේ ධර්මයෝ එක්ව පවත්නාහුද? නොහොත් වෙන් වෙන්ව පවත්නාහුද? මේ ධර්මයන් වෙන් වෙන් කොට ඔවුන්ගේ වෙනස පෙන්වන්නට හැකිද?

**යා චාවුසො, වෙදනා යා ච සඤ්ඤා යඤ්ච විඤ්ඤාණං - ඉමෙ ධම්මා සංසට්ඨා, නො විසංසට්ඨා. න ච ලබ්භා ඉමෙසං ධම්මානං විනිබ්භුජිත්වා විනිබ්භුජිත්වා නානාකරණං පඤ්ඤාපෙතුං. යං හාවුසො), වෙදෙති තං සඤ්ජානාති, යං සඤ්ජානාති තං විජානාති. තස්මා ඉමෙ ධම්මා සංසට්ඨා නො විසංසට්ඨා. න ච ලබ්භා ඉමෙසං ධම්මානං විනිබ්භුජිත්වා විනිබ්භුජිත්වා නානාකරණං පඤ්ඤාපෙතු' න්ති.**

ඇවැත්නි, යම් වේදනාවක් වේද, යම් සංඥාවක් වේද, යම් විඤ්ඤාණයක් වේද මේ ධර්මයෝ එක්ව පවත්නාහුය. වෙන්ව නොපවත්නාහුය. මේ ධර්මයන් වෙන් වෙන් කොට ඔවුන්ගේ වෙනස පෙන්වන්නට නොහැකිය. ඇවැත්නි, යමක් විඳීද එය හඳුනයි යමක් හඳුනාද එය විශේෂයෙන් දනියි. එහෙයින් මේ ධර්මයෝ එක්ව පවත්නාහුය. වෙන්ව නොපවත්නාහුය. මේ ධර්මයන් වෙන් වෙන් කොට ඔවුන්ගේ වෙනස පෙන්වන්ට නොහැකිය.

**09 නිස්සට්ඨෙන හාවුසො, පඤ්චහි ඉන්ද්‍රියෙහි පරිසුද්ධෙන මනොවිඤ්ඤාණෙන කිං නෙය්‍ය' න්ති?**

ඇවැත්නි, පඤ්චෙන්ද්‍රියයන්ගෙන් තොරව, (උපකේලශ රහිත හෙයින්) පිරිසිදුවූ මනො විඤ්ඤාණයෙන් (රූපාවචර චතුර්ථද්ධ්‍යාන සිතින්) කුමක් දතයුතුද?

**නිස්සට්ඨෙන ආවුසො, පඤ්චහි ඉන්ද්‍රියෙහි පරිසුද්ධෙන මනොවිඤ්ඤාණෙන,අනන්තො ආකාසො' ති ආකාසානඤ්චායතනං නෙය්‍යං, 'අනන්තං විඤ්ඤාණ' න්ති විඤ්ඤාණඤ්චායතනං නෙය්‍යං, 'නත්ථි කිඤ්චී' ති ආකිඤ්චඤ්ඤායතනං නෙය්‍ය' න්ති.**

ඇවැත්නි, පඤ්චෙන්ද්‍රියයන්ගෙන් තොරවූ පිරිසිදුවූ මනොවිඤ්ඤාණයෙන් ආකාශය අනන්තයයි ආකාසානඤ්චායතනය දතයුතුයි. විඤ්ඤාණය අනන්තයයි විඤ්ඤාණඤ්චායතනය දතයුතුයි. කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතනය දතයුතුයි.

**10 නෙය්‍යං පනාවුසො, ධම්මං කෙන පජානාතී' ති?**

ඇවැත්නි, නෙය ධර්මය (දතයුතු ධර්මය) කුමකින් දනීද

**නෙය්‍යං ඛො, ආවුසො, ධම්මං පඤ්ඤාචක්ඛුනා පජානාතී' ති.**

ඇවැත්නි, දතයුතු ධර්මය ප්‍රඥා ඇසින් දනියි.

**11 පඤ්ඤා පනාවුසො, කිමත්ථියා' ති?**

ඇවැත්නි, ප්‍රඥාව කුමක් ප්‍රයෝජන කොට ඇත්තීද?

**පඤ්ඤා ඛො, ආවුසො, අභිඤ්ඤත්ථා පරිඤ්ඤත්ථා පහානත්ථාති.**

ඇවැත්නි, ප්‍රඥාව වනාහි දතයුතු ධර්මයන් දැනීම සඳහාද පිරිසිඳිය යුතු ධර්මයන් පිරිසිඳීම පිණිසද පහකළ යුතු ධර්මයන් පහකිරීම සඳහාද පවතියි.

**12 කති පනාවුසො, පච්චයා සම්මාදිට්ඨියා උප්පාදායා' ති?**

ඇවැත්නි, සම්‍යක් දෘෂ්ටිය (විදර්ශනා ප්‍රඥාව හා මාර්ග ප්‍රඥාව) ඉපදීමට කෙතෙක් ප්‍රත්‍යයෝ වෙත්ද?

**ද්වෙ ඛො, ආවුසො, පච්චයා සම්මාදිට්ඨියා උප්පාදාය - පරතො ච ඝොසො, යොනිසො ච මනසිකාරො. ඉමෙ ඛො, ආවුසො, ද්වෙ පච්චයා සම්මාදිට්ඨියා උප්පාදායා' ති.**

ඇවැත්නි, සම්‍යක් දෘෂ්ටිය (විදර්ශනාප්‍රඥාව හා මාර්ගප්‍රඥාව) ඉපදීමට ප්‍රත්‍යය දෙකක් වෙති. පරතො ඝොෂය හා යොනිසොමනසිකාරය (අන්‍යයන් ගෙන් බණ ඇසීම හා නුවණින් කල්පනා කිරීම) යන දෙකයි. ඇවැත්නි, මේ ප්‍රත්‍යය දෙක සම්‍යක් දෘෂ්ටිය (විදර්ශනා ප්‍රඥාව හා මාර්ගප්‍රඥාව) ඉපදීම පිණිස වෙති.

**13 කතිහි පනාවුසො, අඞ්ගෙහි අනුග්ගහිතා සම්මාදිට්ඨි චෙතොවිමුත්තිඵලා ච හොති චෙතොවිමුත්තිඵලානිසංසා ච, පඤ්ඤාවිමුත්තිඵලා ච හොති පඤ්ඤාවිමුත්තිඵලානිසංසා චා' ති?**

ඇවැත්නි, කෙතෙක් අංගයකින් ලබනලද උපකාර ඇති අර්හත්මාර්ග සම්‍යක් දෘෂ්ටිය චිත්ත විමුක්තිය (කෙලෙසුන් කෙරෙන් මිදීම) ඵලය කොට ඇත්තී වේද? චිත්ත විමුක්ති ඵලය අනුසස් කොට ඇත්තීද? ප්‍රඥා විමුක්තිය ඵලය කොට ඇත්තීද? ප්‍රඥා විමුක්ති ඵලය අනුසස්කොට ඇත්තීද?

**පඤ්චහි ඛො, ආවුසො, අඞ්ගෙහි අනුග්ගහිතා සම්මාදිට්ඨි චෙතොවිමුත්තිඵලා ච හොති චෙතොවිමුත්තිඵලානිසංසා ච, පඤ්ඤාවිමුත්තිඵලා ච හොති පඤ්ඤාවිමුත්තිඵලානිසංසා ච. ඉධාවුසො, සම්මාදිට්ඨි සීලානුග්ගහිතා ච හොති, සුතානුග්ගහිතා ච හොති, සාකච්ඡානුග්ගහිතා ච හොති, සමථානුග්ගහිතා ච හොති, විපස්සනානුග්ගහිතා ච හොති. ඉමෙහි ඛො, ආවුසො, පඤ්චහඞ්ගෙහි අනුග්ගහිතා සම්මාදිට්ඨි චෙතොවිමුත්තිඵලා ච හොති චෙතොවිමුත්තිඵලානිසංසා ච, පඤ්ඤාවිමුත්තිඵලා ච හොති පඤ්ඤාවිමුත්තිඵලානිසංසා චා' ති.**

ඇවැත්නි, අංගපසකින් උපකාර ලද්දාවූ සම්‍යක් දෘෂ්ටිය චිත්ත විමුක්තිය ඵලය කොට ඇත්තීය. චිත්ත විමුක්ති ඵලය අනුසස් කොට ඇත්තීය. ප්‍රඥා විමුක්ති ඵලය කොට ඇත්තීය. ප්‍රඥා විමුක්ති ඵලය අනුසස් කොට ඇත්තීය. ඇවැත්නි, මේ ශාසනයෙහි සම්‍යක් දෘෂ්ටිය ශීලයෙන් ලබන ලද උපකාර ඇත්තී වේද, බහුශ්‍රැත බවෙන් ලබනලද උපකාර ඇත්තී වේද, සාකච්ඡාවෙන් ලබනලද උපකාර ඇත්තී වේද, සමථයෙන් ලබනලද උපකාර ඇත්තී වේද, විදර්ශනාවෙන් ලබනලද උපකාර ඇත්තී වේද, ඇවැත්නි, මේ ධර්ම පසකින් උපකාර ලද සම්‍යක් දෘෂ්ටිය චිත්ත විමුක්තිය ඵලය කොට ඇත්තීද වේ. චිත්ත විමුක්ති ඵලය ප්‍රයෝජන කොට ඇත්තීද වේ. ප්‍රඥාවිමුක්තිය ඵලය කොට ඇත්තීද වේ. ප්‍රඥාවිමුක්ති ඵලය ප්‍රයෝජනය කොට ඇත්තීද වේ.

**14 කති පනාවුසො, භවා' ති?**

ඇවැත්නි, භවයෝ කී දෙනෙක්ද?

**තයොමෙ, ආවුසො, භවා - කාමභවො , රූපභවො, අරූපභවො' ති.**

ඇවැත්නි, කාමභවය රූපභවය, අරූප භවයයයි මේ භව තුනකි.

**15 කථං පනාවුසො, ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති හොතී’ ති?**

ඇවැත්නි, කෙසේ නම් නැවත නැවත ඉපදීම වේද?

**අවිජ්ජානීවරණානං ඛො, ආවුසො, සත්තානං තණ්හාසංයොජනානං තත්‍රතත්‍රාභිනන්දනා - එවං ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති හොතී’ ති.**

ඇවැත්නි, අවිද්‍යාවෙන් වැසුනාවූ, තෘෂ්ණාවෙන් බැඳුනාවූ සත්ත්වයින්ගේ ඒ ඒ භවයෙහි ඇලීම ඇතිවෙයි. මෙසේ නැවත නැවත භවයෙහි ඉපදීම ඇති වෙයි.

**16කථං පනාවුසො, ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති න හොතී’ ති?**

ඇවැත්නි, කෙසේ නම් නැවත නැවත භවයෙහි ඉපදීම නොවේද?

**අවිජ්ජාවිරාගා ඛො, ආවුසො, විජ්ජුප්පාදා තණ්හානිරොධා - එවං ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති න හොතී’ ති.**

ඇවැත්නි, අවිද්‍යාව නැති කිරීමෙන් අර්හත් මාර්ග විද්‍යාව පහළවීමෙන් තෘෂ්ණාව නැති කිරීමෙන් මෙසේ නැවත නැවත භවයෙහි ඉපදීම සිදු නොවේ.

**17 කතමං පනාවුසො, පඨමං ඣාන’ න්ති?**

ඇවැත්නි, ප්‍රථමද්ධ්‍යානය නම් කවරේද?

**ඉධාවුසො, භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති - ඉදං වුච්චති, ආවුසො, පඨමං ඣාන’ න්ති.**

ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම කාමයන්ගෙන් වෙන්වම අකුසල ධර්මයන්ගෙන් වෙන්වම විතර්ක සහිතවූ විචාර සහිතවූ විවේකයෙන්

හටගත් ප්‍රීති සැප ඇති ප්‍රථමද්ධ්‍යානයට පැමිණ වාසය කරයි, ඇවැත්නි, මේ ප්‍රථමධ්‍යානයයි කියනු ලැබේ.

**18 පඨමං පනාවුසො, ඣානං කතිඅඞ්ගික’ න්ති?**

ඇවැත්නි, ප්‍රථමධ්‍යානය කෙතෙක් අංගයකින් යුක්තද?

**පඨමං ඛො, ආවුසො, ඣානං පඤ්චඞ්ගිකං. ඉධාවුසො, පඨමං ඣානං සමාපන්නස්ස භික්ඛුනො විතක්කො ච වත්තති, විචාරො ච පීති ච සුඛඤ්ච චිත්තෙකග්ගතා ච. පඨමං ඛො, ආවුසො, ඣානං එවං පඤ්චඞ්ගික’ න්ති.**

ඇවැත්නි, ප්‍රථමධ්‍යානය අංග පසකින් යුක්තය. ඇවැත්නි, මේ ශාසනයෙහි ප්‍රථමධ්‍යානයට සමවදින්නාවූ මහණහට විතර්කයද විචාරයද, ප්‍රීතියද, සැපයද සිත එකඟබවද පවතියි ඇවැත්නි, ප්‍රථමධ්‍යානය මෙසේ අංග පසක් ඇත්තේ වෙයි.

**19 පඨමං පනාවුසො, ඣානං කතඞ්ගවිප්පහීනං කතඞ්ගසමන්නාගත’ න්ති?**

ඇවැත්නි, ප්‍රථමධ්‍යානය කෙතෙක් අංගයකින් දුරුවේද, කෙතෙක් අංගයකින් යුක්තද?

**පඨමං ඛො, ආවුසො, ඣානං පඤ්චඞ්ගවිප්පහීනං, පඤ්චඞ්ගසමන්නාගතං. ඉධාවුසො, පඨමං ඣානං සමාපන්නස්ස භික්ඛුනො කාමච්ඡන්දො පහීනො හොති, බ්‍යාපාදො පහීනො හොති, ථීනමිද්ධං පහීනං හොති, උද්ධච්චකුක්කුච්චං පහීනං හොති, විචිකිච්ඡා පහීනා හොති; විතක්කො ච වත්තති, විචාරො ච පීති ච සුඛඤ්ච චිත්තෙකග්ගතා ච. පඨමං ඛො, ආවුසො, ඣානං එවං පඤ්චඞ්ගවිප්පහීනං පඤ්චඞ්ගසමන්නාගත’ න්ති.**

ඇවැත්නි, ප්‍රථම ධ්‍යානය අංගපසකින් දුරුවේ. අංග පසකින් යුක්තවේ. ඇවැත්නි, මේ ශාසනයෙහි ප්‍රථමද්ධ්‍යානයට සමවැදුනාවූ භික්ෂු වගේ කාමච්ඡන්ද නීවරණය නැති වූයේ වෙයි. ව්‍යාපාද නීවරණය නැති වූයේ වෙයි. ථීනමිද්ධ නීවරණය නැති වූයේ වෙයි. උද්ධච්චකුක්කුච්ච නීවරණය

නැති වූයේ වෙයි. විචිකිච්ඡා නීවරණය නැති වූයේ වෙයි. විතර්කයද, විචාරයද, ප්‍රීතියද, සැපයද සිත එකඟ බවද පවතියි. ඇවැත්නි, මෙසේ ප්‍රථම ධ්‍යානය අංග පසකින් දුරු වූයේද, අංග පසකින් යුක්ත වූයේද වෙයි.

**20 පඤ්චිමානි , ආවුසො, ඉන්ද්‍රියානි නානාවිසයානි නානාගොචරානි, න අඤ්ඤමඤ්ඤස්ස ගොචරවිසයං පච්චනුභොන්ති, සෙය්‍යථීදං - චක්ඛුන්ද්‍රියං, සොතින්ද්‍රියං, ඝානින්ද්‍රියං, ජිව්හින්ද්‍රියං, කායින්ද්‍රියං. ඉමෙසං ඛො, ආවුසො, පඤ්චන්නං ඉන්ද්‍රියානං නානාවිසයානං නානාගොචරානං, න අඤ්ඤමඤ්ඤස්ස ගොචරවිසයං පච්චනුභොන්තානං, කිං පටිසරණං, කො ච නෙසං ගොචරවිසයං පච්චනුභොතී' ති?**

ඇවැත්නි, නොයෙක් අරමුණු විෂයකොට ඇති, නොයෙක් අරමුණු ගොදුරුකොට ඇති, එකිනෙකට අයත්වූ අරමුණු නොගන්නා මේ ඉන්ද්‍රිය පසක් වෙත්. ඔහු කවරහුද? චක්ෂු ඉන්ද්‍රියය, ශ්‍රොත ඉන්ද්‍රියය, ඝ්‍රාණ ඉන්ද්‍රියය, ජිව්හා ඉන්ද්‍රියය, කාය ඉන්ද්‍රියය යනුයි. ඇවැත්නි, නොයෙක් අරමුණු විෂය කොට ඇති, නොයෙක් අරමුණු ගොදුරු කොට ඇති, එකිනෙකට අයත්වූ අරමුණු නොගන්නාවූ මේ ඉන්ද්‍රියයන්ගේ පිහිටීම කුමක්ද, ඔවුන්ගේ අරමුණු රසය කවරෙක් විඳීද?

**පඤ්චිමානි, ආවුසො, ඉන්ද්‍රියානි නානාවිසයානි නානාගොචරානි, න අඤ්ඤමඤ්ඤස්ස ගොචරවිසයං පච්චනුභොන්ති, සෙය්‍යථීදං - චක්ඛුන්ද්‍රියං, සොතින්ද්‍රියං, ඝානින්ද්‍රියං, ජිව්හින්ද්‍රියං, කායින්ද්‍රියං. ඉමෙසං ඛො, ආවුසො, පඤ්චන්නං ඉන්ද්‍රියානං නානාවිසයානං නානාගොචරානං, න අඤ්ඤමඤ්ඤස්ස ගොචරවිසයං පච්චනුභොන්තානං, මනො පටිසරණං, මනො ච නෙසං ගොචරවිසයං පච්චනුභොතී' ති.**

ඇවැත්නි, නොයෙක් අරමුණු විෂයකොට ඇති, නොයෙක් අරමුණු ගොදුරුකොට ඇති, එකිනෙකට අයත්වූ අරමුණු නොගන්නා මේ ඉන්ද්‍රිය පසක් වෙත්. ඔවුහු කවරහුද? චක්ඛු ඉන්ද්‍රියය, සොත ඉන්ද්‍රියය, ඝාණ ඉන්ද්‍රියය, ජිව්හා ඉන්ද්‍රියය, කාය ඉන්ද්‍රියය (යනුයි) ඇවැත්නි, නොයෙක් අරමුණු විෂය කොට ඇති, නොයෙක් අරමුණු ගොදුරු කොට ඇති,

එකිනෙකට අයත්වූ අරමුණු රසය නොගන්නාවූ මේ ඉන්ද්‍රියය පසට සිත පිහිටයි. සිත ඔවුන්ගේ අරමුණු රසය අනුභව කරයි.

**21 පඤ්චිමානි, ආවුසො, ඉන්ද්‍රියානි, සෙය්‍යථීදං - චක්ඛුන්ද්‍රියං, සොතින්ද්‍රියං, ඝානින්ද්‍රියං, ජිව්හින්ද්‍රියං, කායින්ද්‍රියං. ඉමානි ඛො, ආවුසො, පඤ්චින්ද්‍රියානි කිං පටිච්ච තිට්ඨන්තී' ති?**

ඇවැත්නි, මේ ඉන්ද්‍රිය පසක් වෙත්. කවරහුද? චක්ඛු ඉන්ද්‍රියය, සොත ඉන්ද්‍රියය, ඝාණ ඉන්ද්‍රියය, ජිව්හා ඉන්ද්‍රියය, කාය ඉන්ද්‍රියය (යනුයි.) ඇවැත්නි, මේ ඉන්ද්‍රිය පස කුමක් නිසා පවතිත්ද?

**පඤ්චිමානි, ආවුසො, ඉන්ද්‍රියානි, සෙය්‍යථීදං - චක්ඛුන්ද්‍රියං, සොතින්ද්‍රියං, ඝානින්ද්‍රියං, ජිව්හින්ද්‍රියං, කායින්ද්‍රියං. ඉමානි ඛො, ආවුසො, පඤ්චින්ද්‍රියානි ආයුං පටිච්ච තිට්ඨන්තී' ති.**

ඇවැත්නි, මේ ඉන්ද්‍රිය පස ආයුෂ (ජීවිත ඉන්ද්‍රිය) නිසා පවතිත්.

**22 ආයු පනාවුසො, කිං පටිච්ච තිට්ඨතී' ති?**

ඇවැත්නි, ආයුෂය වනාහි කුමක් නිසා පවතීද?

**ආයු උස්මං පටිච්ච තිට්ඨතී' ති.**

ආයුෂය උෂ්ණය (කර්මයෙන් උපන් තෙජො ධාතුව) නිසා පවතියි.

**23 උස්මා පනාවුසො, කිං පටිච්ච තිට්ඨතී' ති?**

ඇවැත්නි, උෂ්ණය කුමක් නිසා පවතීද?

**උස්මා ආයුං පටිච්ච තිට්ඨතී' ති.**

උෂ්ණය ආයුෂ (ජීවිතෙන්ද්‍රිය) නිසා පවතියි.

**24 ඉදානෙව ඛො මයං, ආවුසො, ආයස්මතො සාරිපුත්තස්ස භාසිතං එවං ආජානාම - 'ආයු උස්මං පටිච්ච තිට්ඨතී' ති. ඉදානෙව පන මයං, ආවුසො, ආයස්මතො සාරිපුත්තස්ස භාසිතං එවං ආජානාම - 'උස්මා ආයුං පටිච්ච තිට්ඨතී' ති.**

**යථා කථං පනාවුසො, ඉමස්ස භාසිතස්ස අත්ථො දට්ඨබ්බො' ති?**

ඇවැත්නි, ආයුෂය උෂ්ණය නිසා පවතීයයි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ කීම අපි දැන් මෙසේ දනිමු. ඇවැත්නි, උෂ්ණය ආයුෂය නිසා පවතීයයි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ කීම අපි දැන් මෙසේ දනිමු. ඇවැත්නි, කෙසේ නම් මේ කීමෙහි අර්ථය දත යුතුද?

**තෙන හාවුසො, උපමං තෙ කරිස්සාමි; උපමායපිධෙකච්චෙ විඤ්ඤූ පුරිසා භාසිතස්ස අත්ථං ආජානන්ති. සෙය්‍යථාපි, ආවුසො, තෙලප්පදීපස්ස ඣායතො අච්චිං පටිච්ච ආභා පඤ්ඤායති, ආභං පටිච්ච අච්චි පඤ්ඤායති; එවමෙව ඛො, ආවුසො, ආයු උස්මං පටිච්ච තිට්ඨති, උස්මා ආයුං පටිච්ච තිට්ඨතී ’ ති.**

ඇවැත්නි, එසේවී නම් තොපට උපමාවක් කියමි. මේ ලෝකයෙහි ඇතැම් නුවණ ඇත්තෝ උපමාවෙන්ද කියන ලද්දෙහි අර්ථය දැන ගනිති. ඇවැත්නි, ඇවිලෙන්නාවූ තෙල් පහනෙහි ගිනිදලුව නිසා ආලෝකය පෙනේද, ආලෝකය නිසා ගිනිදලුව පෙනේද, ඇවැත්නි, එපරිද්දෙන්ම ආයුෂය උෂ්ණය නිසා පවතියි. උෂ්ණය ආයුෂ නිසා පවතියි.

**25 තෙව නු ඛො, ආවුසො, ආයුසඞ්ඛාරා, තෙ වෙදනියා ධම්මා උදාහු අඤ්ඤෙ ආයුසඞ්ඛාරා අඤ්ඤෙ වෙදනියා ධම්මා’ ති?**

ඇවැත්නි, ආයුසංස්කාරයෝත් වේදනා ධර්මයෝත් එකක්මද? නැතහොත් ආයුසංස්කාරයෝ වෙනමද? වේදනා ධර්මයෝ වෙනමද?

**‘න ඛො , ආවුසො, තෙව ආයුසඞ්ඛාරා තෙ වෙදනියා ධම්මා. තෙ ච හාවුසො, ආයුසඞ්ඛාරා අභවිංසු තෙ වෙදනියා ධම්මා, න යිදං සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නස්ස භික්ඛුනො වුට්ඨානං පඤ්ඤායෙථ. යස්මා ච ඛො, ආවුසො, අඤ්ඤෙ ආයුසඞ්ඛාරා අඤ්ඤෙ වෙදනියා ධම්මා, තස්මා සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නස්ස භික්ඛුනො වුට්ඨානං පඤ්ඤායතී’ ති.**

ඇවැත්නි, ආයුසංස්කාරයෝත් වේදනා ධර්මයෝත් එකක්ම නොවෙති. ඇවැත්නි, ආයුසංස්කාරයෝත් වේදනාධර්මයෝත් එකක්ම වූවාහු නම් නිරෝධ සමාපත්තියට පැමිණියාවූ භික්ෂුවගේ නැගී සිටීම නොපෙණෙයි. ඇවැත්නි, යම් හෙයකින් ආයුසංස්කාරයෝ අන්‍යයෝද, වේදනාධර්මයෝ අන්‍යයෝද එහෙයින් නිරෝධ සමාපත්තියට පැමිණියාවූ භික්ෂුවගේ නැගීසිටීම පෙණෙයි

**26 යදා නු ඛො, ආවුසො, ඉමං කායං කති ධම්මා ජහන්ති; අථායං කායො උජ්ඣිතො අවක්ඛිත්තො සෙති, යථා කට්ඨං අචෙතන’ න්ති?**

ඇවැත්නි, යම් විටෙක මේ ශරීරය හරණලද, ඉවත දමනලද, සිත් නැති දඬුකඩක් මෙන් පවතීද, එවිට මේ ශරීරය කෙතෙක් ධර්ම අත්හරියිද?

**යදා ඛො, ආවුසො, ඉමං කායං තයො ධම්මා ජහන්ති - ආයු උස්මා ච විඤ්ඤාණං; අථායං කායො උජ්ඣිතො අවක්ඛිත්තො සෙති, යථා කට්ඨං අචෙතන’ න්ති.**

ඇවැත්නි, යම්විටෙක ආයුෂය, උෂ්ණය, විඤ්ඤාණය යන ධර්මතුන මේ ශරීරය අත්හරිද්ද, එකල මේ ශරීරය හරනලද, ඉවත දමනලද, සිත්නැති දඬු කඩක් මෙන් පවතියි.

**27 ය්වායං, ආවුසො, මතො කාලඞ්කතො, යො චායං භික්ඛු සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නො - ඉමෙසං කිං නානාකරණ’ ’ න්ති?**

ඇවැත්නි, යම් මේ සත්ත්වයෙක් තෙම මළේද, කලුරිය කෙළේද, යම් මේ භික්ෂුවක් තෙම නිරෝධ සමාපත්තියට පැමිණියේද, මොවුන් දෙදෙනාගේ වෙනස කුමක්ද?

**ය්වායං, ආවුසො, මතො කාලඞ්කතො තස්ස කායසඞ්ඛාරා නිරුද්ධා පටිප්පස්සද්ධා , වචීසඞ්ඛාරා නිරුද්ධා පටිප්පස්සද්ධා, චිත්තසඞ්ඛාරා නිරුද්ධා පටිප්පස්සද්ධා, ආයු පරික්ඛීණො, උස්මා වූපසන්තා, ඉන්ද්‍රියානි පරිභින්නානි. යො චායං භික්ඛු සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නො තස්සපි කායසඞ්ඛාරා නිරුද්ධා පටිප්පස්සද්ධා, වචීසඞ්ඛාරා නිරුද්ධා පටිප්පස්සද්ධා,**

**චිත්තසඞ්ඛාරා නිරුද්ධා පටිප්පස්සද්ධා, ආයු න පරික්ඛීණො, උස්මා අවූපසන්තා, ඉන්ද්‍රියානි විප්පසන්නානි. ය්වායං, ආවුසො, මතො කාලඞ්කතො, යො චායං භික්ඛු සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නො - ඉදං නෙසං නානාකරණ’ න්ති.**

ඇවැත්නි, යම් මේ පුද්ගලයෙක් තෙම මළේද, කලුරිය කෙළේද, ඔහුගේ කායසංස්කාරය (ආශ්වාස ප්‍රශ්වාස) නැතිවුණේ වෙයි, සංසිඳුනේ වෙයි. වාක්සංස්කාරය (විතර්ක විචාර) නැතිවුණේ වෙයි, සංසිඳුනේ වෙයි. චිත්ත සංස්කාරය (සංඥා වේදනා) නැතිවුණේ වෙයි, සංසිඳුනේ වෙයි, ආයුෂය ගෙවුනේය. උෂ්ණය (කර්මජ තෙජස) සංසිඳුනේය. ඉන්ද්‍රියයෝ බිඳුනාහ. යම් මේ භික්ෂුවක් තෙම නිරෝධසමාපත්තියට පැමිණියේද ඔහුගේද කායසංස්කාර (ආශ්වාස ප්‍රශ්වාස) නැතිවුණේ වෙයි, සංසිඳුණේ වෙයි. වචී සංස්කාරය (විතර්ක විචාර) නැතිවුණේ වෙයි, සංසිඳුණේ වෙයි. චිත්ත සංස්කාර (සංඥා වේදනා) නැතිවුනේ වෙයි, සංසිඳුණේ වෙයි. එහෙත් ආයුෂය නොගෙවුනේය. උෂ්ණය නොසන්සිඳුනේය. ඇස් ආදී ඉන්ද්‍රියයෝ විශේෂයෙන් පැහැදිලියහ. ඇවැත්නි, යම් මේ සත්වයෙක් මළේද, කළුරිය කළේද, යම් මේ භික්ෂුවක් නිරෝධ සමාපත්තියට සම වැදුනේද මොවුන් දෙදෙනාගේ මේ වෙනසයි.

**28 කති පනාවුසො, පච්චයා අදුක්ඛමසුඛාය චෙතොවිමුත්තියා සමාපත්තියා’ ති?**

ඇවැත්නි, අදුක්ඛමසුඛ (දුක්ද නොවූ සැපද නොවූ) චිත්තවිමුක්තියට පැමිණීමෙහි ප්‍රත්‍යයෝ කෙතෙක්ද?

**චත්තාරො ඛො, ආවුසො, පච්චයා අදුක්ඛමසුඛාය චෙතොවිමුත්තියා සමාපත්තියා. ඉධාවුසො, භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. ඉමෙ ඛො, ආවුසො, චත්තාරො පච්චයා අදුක්ඛමසුඛාය චෙතොවිමුත්තියා සමාපත්තියා’ ති.**

ඇවැත්නි, අදුක්ඛමසුඛ (දුක්ද නොවූ සැපද නොවූ) චෙතො විමුක්තියට පැමිණීමෙහි ප්‍රත්‍යය සතරක් වෙත්. ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම සැපය නැති කිරීමෙන්ද, දුක නැති කිරීමෙන්ද, පළමු කොටම සොම්නස් දොම්නස් දෙක දුරලීමෙන් දුක්ද නොවූ, සැපද නොවූ උපෙක්ෂා සිහි පිරිසිදු බව ඇති සතරවන ධ්‍යානයට පැමිණ වාසය කරයි. ඇවැත්නි, මේ වනාහි අදුක්ඛමසුඛ (දුක්ද නොවූ සැපද නොවූ) චිත්ත විමුක්තියට පැමිණීමේ ප්‍රත්‍යය සතරයි.

**29 කති පනාවුසො, පච්චයා අනිමිත්තාය චෙතොවිමුත්තියා සමාපත්තියා’ ති?**

ඇවැත්නි, අනිමිත්ත චිත්තවිමුක්තියට (නිරෝධ සමාපත්තියෙන් නැගී සිටින ඵලසමාපත්තියට) සමවැදීමෙහි ප්‍රත්‍යය කෙතෙක්ද?

**ද්වෙ ඛො, ආවුසො, පච්චයා අනිමිත්තාය චෙතොවිමුත්තියා සමාපත්තියා - සබ්බනිමිත්තානඤ්ච අමනසිකාරො, අනිමිත්තාය ච ධාතුයා මනසිකාරො. ඉමෙ ඛො, ආවුසො, ද්වෙ පච්චයා අනිමිත්තාය චෙතොවිමුත්තියා සමාපත්තියා’ ති.**

ඇවැත්නි, අනිමිත්ත චිත්තවිමුක්තියට පැමිණීමෙහි ප්‍රත්‍යය දෙකකි. සියලු රූපාදී අරමුණු මෙනෙහි නොකිරීම හා නිර්වාණ ධාතුව මෙනෙහි කිරීමය. ඇවැත්නි, අනිමිත්ත චිත්තවිමුක්තියට පැමිණීමෙහි මේ ප්‍රත්‍යය දෙක වෙයි

**30 කති පනාවුසො, පච්චයා අනිමිත්තාය චෙතොවිමුත්තියා ඨිතියා’ ති?**

ඇවැත්නි, අනිමිත්ත චිත්තවිමුක්තිහුගේ පැවැත්ම පිණිස ප්‍රත්‍යය කෙතෙක්ද?

**තයො ඛො, ආවුසො, පච්චයා අනිමිත්තාය චෙතොවිමුත්තියා ඨිතියා - සබ්බනිමිත්තානඤ්ච අමනසිකාරො, අනිමිත්තාය ච ධාතුයා මනසිකාරො, පුබ්බෙ ච අභිසඞ්ඛාරො. ඉමෙ ඛො, ආවුසො, තයො පච්චයා අනිමිත්තාය චෙතොවිමුත්තියා ඨිතියා’ ති.**

ඇවැත්නි, අනිමිත්ත චිත්ත විමුක්තිහුගේ පැවැත්ම පිණිස ප්‍රත්‍යය තුනෙකි. සියලු රූපාදී නිමිති මෙනෙහි නොකිරීමද, නිර්වාණධාතුව මෙනෙහි කිරීමද, සමවැදීමට පළමුව කාලය පිරිසිඳීමද යන (තුනයි.) ඇවැත්නි, අනිමිත්ත චිත්ත විමුක්තිහුගේ පැවැත්මට මේ ප්‍රත්‍යය තුන වෙයි.

**31 කති පනාවුසො, පච්චයා අනිමිත්තාය චෙතොවිමුත්තියා වුට්ඨානායා’ ති?**

ඇවැත්නි, ඵල සමාපත්තියෙන් නැගීසිටීමට ප්‍රත්‍යය කෙතෙක්ද?

**ද්වෙ ඛො, ආවුසො, පච්චයා අනිමිත්තාය චෙතොවිමුත්තියා වුට්ඨානාය - සබ්බනිමිත්තානඤ්ච මනසිකාරො, අනිමිත්තාය ච ධාතුයා අමනසිකාරො. ඉමෙ ඛො, ආවුසො, ද්වෙ පච්චයා අනිමිත්තාය චෙතොවිමුත්තියා වුට්ඨානායා’ ති.**

සියලු රූපාදි නිමිති මෙනෙහි කිරීමද, නිර්වාණ ධාතුව මෙනෙහි නොකිරීමද යන දෙකයි, ඇවැත්නි, අනිමිත්ත චෙතොවිමුක්තියෙන් නැගී සිටීමට මේ ප්‍රත්‍ය දෙක වෙයි.

**32 යා චායං, ආවුසො, අප්පමාණා චෙතොවිමුත්ති, යා ච ආකිඤ්චඤ්ඤා චෙතොවිමුත්ති, යා ච සුඤ්ඤතා චෙතොවිමුත්ති, යා ච අනිමිත්තා චෙතොවිමුත්ති - ඉමෙ ධම්මා නානාත්ථා චෙව නානාබ්‍යඤ්ජනා ච උදාහු එකත්ථා බ්‍යඤ්ජනමෙව නාන’ න්ති?**

ඇවැත්නි, අප්පමාණ නම්වූ යම් චිත්ත විමුක්තියක් වේද, ආකිඤ්චඤ්ඤ නම්වූ යම් චිත්තවිමුක්තියක් වේද, යම් සුඤ්ඤත නම් චිත්ත විමුක්තියක් වේද, යම් අනිමිත්ත නම්වූ චිත්ත විමුක්තියක් වේද, මේ ධර්මයෝ නොයෙක් අර්ථ ඇත්තාහුද? නොයෙක් අක්ෂර ඇත්තාහුද? නොහොත් එකම අර්ථ ඇත්තෝද? අක්ෂර පමණක් වෙනස්ද.

**යා චායං, ආවුසො, අප්පමාණා චෙතොවිමුත්ති, යා ච ආකිඤ්චඤ්ඤා චෙතොවිමුත්ති, යා ච සුඤ්ඤතා**

**චෙතොවිමුත්ති, යා ච අනිමිත්තා චෙතොවිමුත්ති - අත්ථි ඛො, ආවුසො, පරියායො යං පරියායං ආගම්ම ඉමෙ ධම්මා නානාත්ථා චෙව නානාබ්‍යඤ්ජනා ච; අත්ථි ච ඛො, ආවුසො, පරියායො යං පරියායං ආගම්ම ඉමෙ ධම්මා එකත්ථා, බ්‍යඤ්ජනමෙව නානං.**

ඇවැත්නි, යම් අප්පමාණ නම් චිත්තවිමුක්තියක් වේද, යම් ආකිංචඤ්ඤ නම් චිත්තවිමුක්තියක් වේද, යම් සුඤ්ඤත නම් චිත්තවිමුක්තියක් වේද, යම් අනිමිත්ත නම් චිත්තවිමුක්තියක් වේද, ඇවැත්නි, යම් ක්‍රමයකට පැමිණ මේ ධර්මයෝ නොයෙක් අර්ථ ඇත්තාහු නොයෙක් අක්ෂර ඇත්තාහු වෙත්ද, එබඳු ක්‍රමයක්ද ඇත. ඇවැත්නි, යම් ක්‍රමයකට පැමිණ මේ ධර්මයෝ එකම අර්ථ ඇත්තාහු අක්ෂරයෙන් පමණක් වෙනස්වූවාහු වෙත්ද, එබඳු ක්‍රමයක්ද ඇත.

**33 කතමො චාවුසො, පරියායො යං පරියායං ආගම්ම ඉමෙ ධම්මා නානාත්ථා චෙව නානාබ්‍යඤ්ජනා ච?**

ඇවැත්නි, යම් ක්‍රමයකට පැමිණ මේ ධර්මයෝ නොයෙක් අර්ථවත් වූවාහු අක්ෂරයෙන් වෙනස් වූවාහු වෙද්ද, ඒ ක්‍රමය කුමක්ද?

**ඉධාවුසො, භික්ඛු මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති, තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථං. ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාබජ්ඣෙන ඵරිත්වා විහරති. කරුණාසහගතෙන චෙතසා...පෙ.... මුදිතාසහගතෙන චෙතසා... උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති, තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථං. ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං උපෙක්ඛාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාබජ්ඣෙන ඵරිත්වා විහරති. අයං වුච්චතාවුසො, අප්පමාණා චෙතොවිමුත්ති.**

ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම මෛත්‍රී සහගතවූ සිතින් එක් දිසාවක් පැතිර වාසය කරයිද, එසේම දෙවන දිසාවද එසේම තුන්වන දිසාවද එසේම සතරවන දිසාවද, මෙසේ උඩ යට, සරස සියලු තන්හි, සියලු

ආකාරයෙන්, සියල්ලෙන් යුක්තවූ ලෝකය, මහත්වූ, මහත් බවට පැමිණියාවූ අප්‍රමාණවූ වෛර රහිතවූ, ව්‍යාපාද රහිතවූ, මෛත්‍රී සහගත සිතින් පැතිර වාසය කරයිද, කරුණා සහගත සිතින් එක් දිශාවක් පැතිර වාසය කරයිද, එසේම දෙවන දිශාවද, එසේම තුන්වන දිශාවද, එසේම සතරවන දිශාවද මෙසේ උඩ, යට, සරස, සියලු තැන්හි, සියලු ආකාරයෙන්, සියල්ලෙන් යුක්තවූ ලෝකය මහත්වූ, මහත් බවට පැමිණියාවූ, අප්‍රමාණවූ, වෛර රහිතවූ, ව්‍යාපාද රහිතවූ කරුණා සහගත සිතින් පැතිර වාසය කරයිද.

මුදිතා සහගත සිතින් එක් දිශාවක පැතිර වාසය කරයිද එසේම දෙවන දිශාවද, එසේම තුන්වන දිශාවද, එසේම සතරවන දිශාවද, මෙසේ උඩ, යට, සරස, සියලු තැන්හි, සියලු ආකාරයෙන්, සියල්ලෙන් යුක්තවූ ලෝකය, මහත්වූ මහත් බවට පැමිණියාවූ, අප්‍රමාණවූ, වෛර රහිතවූ, ව්‍යාපාද රහිතවූ, මුදිතා සහගත සිතින් පැතිර වාසය කරයිද.

උපෙක්ෂා සහගත සිතින් එක් දිශාවක පැතිර වාසය කරයිද එසේම දෙවන දිශාවද, එසේම තුන්වන දිශාවද, එසේම සතරවන දිශාවද, මෙසේ උඩ, යට, සරස, සියලු තැන්හි සියලු ආකාරයෙන් සියල්ලෙන් යුක්තවූ ලෝකය, මහත්වූ, මහත් බවට පැමිණියාවූ, අප්‍රමාණවූ, වෛර රහිතවූ, ව්‍යාපාද රහිතවූ, උපෙක්ෂා සහිත සිතින් පැතිර වාසය කරයි. ඇවැත්නි, මේ වනාහි අප්‍රමාණ චෙතොවිමුක්තිය යයි කියනු ලැබේ.

**34 කතමා චාවුසො, ආකිඤ්චඤ්ඤා චෙතොවිමුත්ති?**

ඇවැත්නි, ආකිඤ්චඤ්ඤායතන චිත්ත විමුක්තිය කවරීද

**ඉධාවුසො, භික්ඛු සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. අයං වුච්චතාවුසො, ආකිඤ්චඤ්ඤා චෙතොවිමුත්ති.**

ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම සියලු ආකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියට පැමිණ වාසය කරයිද, ඇවැත්නි, මෙය ආකිචඤ්ඤ නම් චිත්ත විමුක්තියයි කියනු ලැබේ.

**35 කතමා චාවුසො, සුඤ්ඤතා චෙතොවිමුත්ති?**

ඇවැත්නි, සුඤ්ඤත චිත්ත විමුක්තිය කවරීද

**ඉධාවුසො, භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා ඉති පටිසඤ්චික්ඛති - 'සුඤ්ඤමිදං අත්තෙන වා අත්තනියෙන වා' ති. අයං වුච්චතාවුසො, සුඤ්ඤතා චෙතොවිමුත්ති.**

ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම අරණ්‍යකට ගියේ හෝ රුකෙක් මුලට ගියේ හෝ ශූන්‍යාගාරයකට ගියේ හෝ 'මෙය ආත්මයෙන් හෝ, ආත්මය පිළිබඳ වූවකින් හෝ හිස්ය' යි කල්පනා කරයිද ඇවැත්නි, මෙය සුඤ්ඤත චෙතොවිමුක්තියයයි කියනු ලැබේ.

**36 කතමා චාවුසො, අනිමිත්තා චෙතොවිමුත්ති?**

ඇවැත්නි, අනිමිත්ත චිත්තවිමුක්තිය කවරීද

**ඉධාවුසො, භික්ඛු සබ්බනිමිත්තානං අමනසිකාරා අනිමිත්තං චෙතොසමාධිං උපසම්පජ්ජ විහරති. අයං වුච්චතාවුසො, අනිමිත්තා චෙතොවිමුත්ති. අයං ඛො, ආවුසො, පරියායො යං පරියායං ආගම්ම ඉමෙ ධම්මා නානාත්ථා චෙව නානාබ්‍යඤ්ජනා ච.**

ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම සියලු රූපාදි නිමිති මෙනෙහි නොකිරීමෙන් නිමිත්ත රහිතවූ චිත්ත සමාධියට පැමිණ වාසය කරයිද, ඇවැත්නි, මෝ තොම අනිමිත්ත චිත්ත විමුක්තියයයි කියනු ලැබේ. ඇවැත්නි, යම් ක්‍රමයකට පැමිණ මේ ධර්මයෝ වෙනස් අර්ථ ඇත්තාහු වෙත්ද, වෙනස් අක්ෂර ඇත්තාහු වෙත්ද මේ ඒ ක්‍රමයයි

**37 කතමො චාවුසො, පරියායො යං පරියායං ආගම්ම ඉමෙ ධම්මා එකත්ථා බ්‍යඤ්ජනමෙව නානං?**

**රාගො ඛො, ආවුසො, පමාණකරණො, දොසො පමාණකරණො, මොහො පමාණකරණො. තෙ ඛීණාසවස්ස භික්ඛුනො පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවංකතා ආයතිං අනුප්පාදධම්මා. යාවතා ඛො, ආවුසො, අප්පමාණා**

**චෙතොවිමුත්තියො, අකුප්පා තාසං චෙතොවිමුත්ති අග්ගමක්ඛායති. සා ඛො පනාකුප්පා චෙතොවිමුත්ති සුඤ්ඤා රාගෙන, සුඤ්ඤා දොසෙන, සුඤ්ඤා මොහෙන. රාගො ඛො, ආවුසො, කිඤ්චනො, දොසො කිඤ්චනො, මොහො කිඤ්චනො. තෙ ඛීණාසවස්ස භික්ඛුනො පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවංකතා ආයතිං අනුප්පාදධම්මා. යාවතා ඛො, ආවුසො, ආකිඤ්චඤ්ඤා චෙතොවිමුත්තියො, අකුප්පා තාසං චෙතොවිමුත්ති අග්ගමක්ඛායති. සා ඛො පනාකුප්පා චෙතොවිමුත්ති සුඤ්ඤා රාගෙන, සුඤ්ඤා දොසෙන , සුඤ්ඤා මොහෙන. රාගො ඛො, ආවුසො, නිමිත්තකරණො, දොසො නිමිත්තකරණො, මොහො නිමිත්තකරණො. තෙ ඛීණාසවස්ස භික්ඛුනො පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවංකතා ආයතිං අනුප්පාදධම්මා. යාවතා ඛො, ආවුසො, අනිමිත්තා චෙතොවිමුත්තියො, අකුප්පා තාසං චෙතොවිමුත්ති අග්ගමක්ඛායති. සා ඛො පනාකුප්පා චෙතොවිමුත්ති සුඤ්ඤා රාගෙන, සුඤ්ඤා දොසෙන, සුඤ්ඤා මොහෙන. අයං ඛො, ආවුසො, පරියායො යං පරියායං ආගම්ම ඉමෙ ධම්මා එකත්ථා බ්‍යඤ්ජනමෙව නාන ‘න්ති.**

**ඉදමවොචායස්මා සාරිපුත්තො. අත්තමනො ආයස්මා මහාකොට්ඨිකො ආයස්මතො සාරිපුත්තස්ස භාසිතං අභිනන්දීති.**

ඇවැත්නි, යම් ක්‍රමයකට පැමිණ මේ ධර්මයෝ අර්ථයෙන් එකක් වූවාහුද, අක්ෂරයෙන් පමණක් වෙනස් වෙත්ද, ඒ ක්‍රමය කවරේද?

ඇවැත්නි, රාගය වනාහි ප්‍රමාණ කරණ (පුද්ගලයාගේ ප්‍රමාණය දක්වන) ධර්මයෙකි. ද්වේෂය ප්‍රමාණ කරණ ධර්මයෙකි. මෝහය ප්‍රමාණ කරණ ධර්මයෙකි. රහත් භික්ෂුවගේ ඒ රාගාදිය නැති වූවාහුය. උදුරනලද මුල් ඇත්තාහුය. අගින් කැපූ තල් ගසක් මෙන් කරන ලද්දහ. විනාශ කරන ලදහ. මත්තෙහි නූපදනා ස්වභාව ඇත්තාහ. ඇවැත්නි, අප්‍රමාණ

චිත්තවිමුක්තීහු යම් පමණක් වෙත්ද, ඔවුන් අතුරෙන් අර්හත්ඵල චිත්ත විමුක්තිය අග්‍රයයි කියනු ලැබේ. ඒ අර්හත්ඵල චිත්ත විමුක්තිය රාගයෙන් හිස්ය. ද්වේෂයෙන් හිස්ය. මෝහයෙන් හිස්ය.

ඇවැත්නි, රාගය වනාහි (සත්ත්වයන් මඩින හෙයින්) පළිබොධයෙකි. ද්වේෂය පළිබොධයෙකි. මෝහය පළිබොධයෙකි. රහත් භික්ෂුවගේ ඒ රාගාදිය නැති වූවාහුය. මුල් උදුරන ලද්දාහුය. සිදිනලද තල් ගසක් මෙන් කරනලදහ. මතු නූපදින ස්වභාව ඇත්තාහ. ඇවැත්නි, ආකිඤ්චඤ්ඤ චිත්තවිමුත්තීහු යම් පමණ වෙත්ද, ඔවුනතුරෙන් අර්හත්ඵල චිත්ත විමුක්තිය අග්‍රයයි කියනු ලැබේ. ඒ අර්හත් ඵල විමුක්තිය රාගයෙන් හිස්ය, ද්වේෂයෙන් හිස්ය, මෝහයෙන් හිස්ය.

ඇවැත්නී, රාගය වනාහි (පෘථග්ජන පුද්ගලයා) හැඳින ගැණීමට ලකුණකි. ද්වේෂය හැඳින ගැනීමට ලකුණකි. මෝහය හැඳින ගැනීමට ලකුණකි. රහත් භික්ෂුවගේ ඒ රාගාදිය නැති වූවාහුය. සිදිනලද මුල් ඇත්තාහ. සිදිනලද තල් ගසක් මෙන් කරන ලදහ. නැති කරණ ලදහ. මත්තෙහි නූපදිනා ස්වභාව ඇත්තාහ. ඇවැත්නි, අනිමිත්ත චිත්ත විමුක්තීහු යම් පමණ වෙත්ද, ඔවුනතුරෙන් අර්හත්ඵල විමුක්තිය අග්‍රයයි කියනු ලැබේ. ඒ අර්හත්ඵල චිත්තවිමුක්තිය රාගයෙන් හිස්ය, ද්වේෂයෙන් හිස්ය, මෝහයෙන් හිස්ය, ඇවැත්නි, යම් ක්‍රමයකට පැමිණ මේ ධර්මයෝ එකාට ඇත්තාහු වෙත්ද, අක්ෂරයෙන් පමණක් වෙනස් වෙත්ද, මේ ඒ ක්‍රමයයි.”

ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මෙය ප්‍රකාශ කළහ. සතුටුවූ මහා කොට්ඨිත ස්ථවිරයන් වහන්සේ ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ දේශනාව සතුටින් පිළිගත්හ.

**(මජ්ඣිමනිකාය-මූලපණ්ණාසපාළි-චූළයමකවග්ගො-මහාවෙදල්ලසුත්ත)**